# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2000 අංක 13 දරන ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කලේ 2000 මැයි මස 22 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 මැයි මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**2000 අංක 13 දරන ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2000 මැයි මස 22 වන දින.]

එල්. ඩී.–ඕ. 72/98.

**ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, ඒ පදනමේ සාමාජිකයන් විසින් එකඟවන ලද රීතිවලට අනුකූලව, එකී පදනමේ පරමාර්ථ ඵලදායී ලෙස කරගෙන යාමේ හා එකී පදනම හා සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවන ලද්දේ යම් පරමාර්ථ හා කාරණා සඳහාද, ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් ද, ඒ පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් හා ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 2000 අංක 13 දරන ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන්, මේ පනත ආරම්භවන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ධර්ම චක්‍ර ළමා පදනම යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධ ද සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය සංස්ථාවට ඇත්තේ ය. ශ්‍රී ලංකාවේ ධර්ම චක්‍ර ළමා පදනම සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරමාර්ථ සඳහාද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතුයයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකාවේ වරප්‍රසාද අඩු ළමයින්ගේ සමාජයීය, අධ්‍යාපනික හා සංස්කෘතික වර්ධනය උදෙසා කටයුතු කිරීම ;

(ආ) දිළිඳු ශ්‍රී ලාංකිකයන්ට, විශේෂයෙන්ම අනාථ ළමයින්ට ආහාර, ඇඳුම් පැළඳුම්, නිවාස සහ වෙනත් අවශ්‍ය සහන සැපයීම ;

(ඇ) ශ්‍රී ලාංකීය ජනතාවගේ ශාරීරික, අධ්‍යාත්මික සහ සමාජ සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) ශ්‍රී ලංකාවේ යෞවනයන් අතර ජාතික සමගිය සහ විවිධ ජාතීන්ට අයත් ශ්‍රී ලාංකික යෞවනයන් අතර අන්‍යෝන්‍ය විශ්වාසය නංවාලීම සහ ඔවුන් තුළ විනය ගරුක බව හා ආත්ම විශ්වාසය තහවුරු කිරීම ;

(ඉ) ශ්‍රී ලාංකික යෞවනයන් සහ වෙනත් ජාතීන්ට අයත් යෞවනයන් අතර, උචිත ක්‍රම මගින් මිත්‍ර සම්බන්ධතා නංවාලීම ;

(ඊ) යෞවනයන් සඳහා අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ ව්‍යාපාරික ව්‍යවසායන් ආරම්භ කිරීමට හෝ ස්වයං රැකියාවල යෙදීම පිණිස ඔවුනට මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම ;

(උ) ථෙරවාදී බෞද්ධ දර්ශනය හා ජීවන මාර්ගය ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පතළ කිරීම ;

(ඌ) පරිසරය ආරක්ෂා කිරීමට බාල පරපුර දිරිගැන්වීම සහ පරිසරය සාර්ථකව කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට අවබෝධයක් ලබා දීම ;

(එ) සංස්ථාවේ පරමාර්ථ ඉදිරියට ගෙනයාමෙහි නිරත භික්ෂූන්ට සහ ස්වේච්ඡා සේවකයන්ට ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර සහ ප්‍රදාන සැපයීම ;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍ය වියහැකි පාසල්, පුස්තකාල සහ අනාථ නිවාස වැනි ආයතන පිහිටුවා පවත්වාගෙන යාම ;

(ඔ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා දේශන, සම්මන්ත්‍රණ, සාකච්ඡා මුළු, වැඩමුළු, ප්‍රදර්ශන සහ වෙනත් යෝග්‍ය වැඩසටහන් ආරම්භ කිරීම, සංවිධානය කිරීම සහ පැවැත්වීම ;

(ඕ) සංස්ථාවේ පරමාර්ථ හා සමාන පරමාර්ථ ඇති වෙනත් ආයතන හා සංවිධාන සමග සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම ;

(ක) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම පිණිස අවශ්‍ය, හිතකර හෝ ඊට ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

4. මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට පහත දැක්වෙන බලතල ඇත්තේය :- සංස්ථාවේ බලතල.

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගේ අරමුදල් ලබාගැනීම සහ මුදලින් හෝ ද්‍රව්‍යයෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබාගැනීම ;

(ආ) යම් චංචල හෝ නිශ්චල දේපළක් ඕනෑම ආකාරයකින් අත්කර ගැනීම සහ දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඇ) සංස්ථාවේ අරමුදල්, වැඩි ආදායමක් ලබාදීමට ඉඩ ඇති යම් ආයෝජනවල ආයෝජනය කිරීම හා එවැනි ආයෝජන ආපසු ගැනීම හෝ ප්‍රතිආයෝජනය කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන් සේවයෙහි යොදා ගැනීම, නියුක්ත කර ගැනීම හා ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ ඒ නිලධරයන් හා සේවකයන් විෂයයෙහි විනය පාලනය ක්‍රියාත්මක කිරීම ;

(ඉ) බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වසා දැමීම සහ ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනිමෙහිලා අවශ්‍ය හෝ යෝග්‍ය වෙනත් සියලු ක්‍රියා හා දේ ඉටුකිරීම හා ක්‍රියාවෙහි යෙදවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) පදනමේ සමාරම්භක ස්වාමීන්වහන්සේ, භික්ෂු අනුශාසක ස්වාමීන්වහන්සේ දෙනම, ගිහි අනුශාසකයන් දෙදෙනා, සභාපති, උප සභාපති, ප්‍රධාන ලේකම්, උපලේකම්, භාණ්ඩාගාරික සහ සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන කාරක සභිකයන් යම් සංඛ්‍යාවකින් සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධානවලට සහ තත්කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම දිනයේ දී ධුර දැරූ පදනමේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සාමාජිකයන් ඇතුළත් කරගැනිමේ, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම, කළමනාකාර මණ්ඩලය සහ සංස්ථාවේ නොයෙකුත් නිලධාරීන්ගේ හා සේවකයන්ගේ කටයුතු කරගෙන යාම, සංස්ථාවේ සහ කළමනාකාර මණ්ඩලයේ රැස්වීම්වල දී කටයුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, මහා සභා රැස්වීමක දී හා ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරනු ලබන යම් රීතියක්, සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් හැර, වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ආරම්භවීමේ දිනයට ඉහතින් ම වූ දිනයෙහි බලාත්මකව පැවති, පදනමේ රීති, ඒ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අය විය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම දිනයේ පැවති පදනමේ ණය සහ බැරකම්, සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර පදනමට අයවිය යුතු සියලු ණය හා ඒ දිනට පදනමට ගෙවනු ලැබිය යුතුව ඇති දායක මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

**8.** යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙහි ලා බලය හා හැකියාව තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**9.** සංස්ථාවේ මුද්‍රාව ප්‍රධාන ලේකම්වරයා භාරයෙහි තිබිය යුතු අතර, එය සභාපතිවරයා සහ අනුශාසකවරුන් අතුරින් යම් අනුශාසකවරයකු ඉදිරිපිට දී හැර, කවර හෝ ලේඛනයකට හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඒ සභාපතිවරයා හා අනුශාසකවරයා විසින් තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ ලේඛනයට හෝ සාධන පත්‍රයට තම නම් අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හෝ හානියක් බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.